හිජාස් හිස්බුල්ලා සම්බන්ධයෙන් වූ හඳුනාගැනීමේ පෙරෙට්ටුව උසාවිය විසින් අවලංගු කිරීම පිළිබඳව දිවයින පුවත්පත සහ ඩේලි එෆ්ටී පුවත්පත මගින් පළ කොට තිබූ පුවත් වාර්තාවන් දෙකක් අපගේ අවධානයට යොමු විණි.

දිවයින පුවතෙහි එක් තැනක සඳහන් වන්නේ, "හඳුනාගැනීමේ පෙරෙට්ටුව සඳහා කැඳවා තිබූ ළමුන්ගේ නිවාසවලට ගොස් ඇති එක්තරා සංවිධානාත්මක කණ්ඩායමක, විමර්ශන නිලධාරීන් විවිධ බලපෑම් කර ප්‍රකාශ ලබාගත් බවට අධිකරණයට ප්‍රකාශ කරන ලෙස එම ළමුන්ට බලපෑම් කර ඇති බවට තොරතුරු ලැබී ඇති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණය හමුවේ පැවසීය" යනුවෙනි. එතැනින් එහාට ඒ සම්බන්ධයෙන් කිසිදු කරුණක් දිවයින පුවත් වාර්තාවෙහි සඳහන් නොවිණි.

කෙසේ නමුත් අනෙකුත් කරුණු අතර මේ පිළිබඳවද වාර්තා කර තිබූ ඩේලි එෆ්ටී පුවත්පත ඒ සම්බන්ධයෙන් තවදුරටත් වාර්තා කරමින් දක්වන්නට යෙදුණේ, ළමුන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා ඒ සම්බන්ධයෙන් දැක්වූ ප්‍රතිචාරයයි. ඔහු විසින් දක්වා තිබුණේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නීත්‍යානුකූල නොවන ක්‍රියාවන් සම්බන්ධයෙන් තොරතුරු ලැබුණු පසු ළමුන්ගේ නිවෙස් වලට ගියේ ඔහු බවයි.

මෙම පුවත් වාර්තාවන් දෙක කියැවීමේදී පාඨකයින් ලෙසට අපට පැන නගිනා ගැටළුව මෙයයි. අධිකරණයේදී දිගහැරුණු මෙම සම්පූර්ණ සිදුවීම සම්බන්ධයෙන් අදහසක් ලබාගැනීමට නම්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම මෙන්ම ප්‍රතිපාර්ශවයෙන් ඊට ලැබුණු ප්‍රතිචාරයද වාර්තා විය යුතු නොවේද? එසේ නැතිව එක් පාර්ශවයක් දැක්වූ අදහස් පමණක් පුවත් වාර්තාවක ඇතුළත් වීම අසම්පූර්ණ වාර්තාකරණයක් නොවේද? ඒ ඔස්සේ සිදුවන්නේ පාඨකයා නොමග යැම නොවේද?

#MediaEthicsSL #lka #SinhalaPress #EnglishPress #News #Divaina #DailyFT